ව්‍යාපෘතියේ නම ඉල්වත්ත අමුණ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

# ඉල්වත්ත අමුණ සංවර්ධන වැඩසටහන

## 01) හැඳින්වීම

වැලිගම ගොවිජන සේවා බල ප්‍රදේශය ග්‍රාම නිලධාරි වසම් 23කින් සමන්විත වන අතර, වසමේ ජීවත්වන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වී ඇත්තේ කෘෂිකර්මාන්තයයි. එයිනුත් වසම් 20ක් සෘජුවම වී ආර්ථිකය ප්‍රධාන කොටගත් ජීවන තත්ත්වයක් ප්‍රදර්ශනය කරයි.

භූමි ව්‍යාප්තිය සැලකූ කල බොරාල වැව වාරි කර්මාන්තය යටතේ අක්කර 200ක් පමණ පෝෂණය ලබන අතර ඉල්වත්ත වාරි කර්මාන්තය යටතට අක්කර 1700ක් පමණ ගොනු වී ඇත.

2014, 2015, 2016 යන වර්ෂය සලකා බැලීමේදී මෙම වගාවන බිම් ප්‍රමාණය ක්‍රමිකව අඩුවීමක් සිදුව ඇත. ඒ සඳහා විවිධ හේතු බලපා ඇති අතර, ඉන් ප්‍රධානම හේතුවෙන් බවට පත්වන්නේ ඉල්වත්ත අමුණ ව්‍යාපාරය අඩාලවීම හේතුවෙන් මේවනවිට අත්පත් කරගෙන ඇති ගැටලු සහගත තත්ත්වයන්ය.

විශේෂයෙන්ම මෙම වගා බිම් ප්‍රදේශයේ මුහුදු මට්ටමේ සිට අඟල් 06ක් අඩි 02ක් අතර ප්‍රමාණයේ උසකින් පිහිටා ඇති අතර, පොල් අතු ගඟ මෝය ආසන්නයේ මෝය සීමාවේ සිට කි. මී. 2ක් පමණ රට තුලට වන්නට ඉල්වත්ත අමුණ පිහිටා ඇත. මෙම අමුණ මගින් වඩදිය අවස්ථා වල කරදිය ඉහලට ගලා ඒම වළක්වන අතර, අමුණ අඩාලන් වීමත් සමග මෙම කරදිය ගලා ඒම පාලනය වීම අක්‍රමවත් වී ඇත. මේ හේතුව නිසා ස්වභාවිකව පිහිටි හැල් තත්ත්වය වඩා තීව්‍ර කරමින් ගොවිමහතුන් වගාවෙන් ඉවත්ව ඇත. එමෙන්ම වගා කරන අතරතුර කරදිය ගැලීම වී වගාවට ඉතාමත් අහිතකර ලෙස බලපානු ලබයි. මෙම හේතුවල සමස්ත ප්‍රතිඵලය වී ඇත්තේ කන්න පතා වගාවන ප්‍රමාණය අඩුවෙමින් පැවතීමයි.

ඉල්වත්ත අමුණ පිහිටි ස්ථානය හා සැලකීමේදී අමුණ දොර යොදා පිටාර ක්‍රමය යටතේ ජලය යායට ලබා ගන්නා අතර, දොර විවෘත කර ජලය ඉවත්කරමින් වැපිරීමේ කටයුතු සිදු කරනු ලබයි. එමෙන්ම මෙම අමුණෙන් සිදු කරන කරදිය පාලන ක්‍රමය වැලිගම ජනතාවට පානීය ජලය සැපයීමට විශාල පිටුබලයක් ලබාදී ඇති අතර, අමුණ අඩාලන්වීම හා හරිහැටි ක්‍රියාත්මක නොවීම ජල සම්පාදන මණ්ඩලයට පානීය ජලය ලබා ගැනීමටද සීමාකම් ඇතිකර ඇත.

ආරම්භයේදී මෙම අමුණු කර්මාන්තය ප්‍රධාන වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතට පත්කර ඉදිකිරීම් කටයුතු සිදුවුවද පරිපාලනයේ පහසුව හෝ වෙනයම්

හේතුවක් මත වර්තමානයේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතට පත්කර ඇත.

## ව්‍යාපෘති අරමුණ

1. ඉල්වත්ත අමුණ ප්‍රතිසංස්කරණය
2. යාය වල ඇල මාර්ග කි.මී. 20ක් රොන්මඩ ඉවත් කිරීම.
3. කෘෂි මාර්ග කි.මී. 12ක් සංවර්ධනය කිරීම.
4. අක්කර 1734 යල හා මහ වී වගාවට යෙදවීම.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලසීමාව 2026 හා 2027 වර්ෂවල

ව්‍යාපෘතිය සඳහා වැයවන ප්‍රතිපාදන රු.මි.594.34